දිවයින පුරා ගුරු මහත්ම මහත්මීන් පුහුණු කරවීම සහ දැනුවත් කරවීම අරමුණු කරගත්

# ළමා මිතුරු නව අධ්‍යාපන අත්පොත එළිදැක්වෙයි

2012 ජූනි 11, කොළඹ - අධ්‍යාපන අමාත්‍යාංශය, යුනිසෙෆ් සහ අන්තර්ජාතික සංවර්ධනය පිළිබඳ ඕස්ට්‍රේලියානු ඒජන්සියේ (AusAID) සහයෝගිතාවයෙන් "ළමා මිතරු පාසල්" නව අධ්‍යාපන අත්පොත එළි දක්වා ඇත. එය ශ්‍රී ලංකාවේ සෑම පළාතක්ම නියෝජනය කෙරුණු පළාත් අධ්‍යාපන කාර්ය මණ්ඩලයේ සහභාගිත්වයෙන් පැවති ජාතික අධ්‍යාපන සමුළුවේ දී සිදු කෙරිණි.

"ළමා මිතරු පාසල්" නව අධ්‍යාපන අත්පොත සිංහල සහ දෙමළ යන ද්විභාෂාවන්ගෙන් සකස් කර ඇත. දිවයිනේ සියලුම ප්‍රාථමික පාසල්වල අධ්‍යාපන මට්ටම ඉහළ නැංවීමට අවශ්‍ය තීරණාත්මක කරුණු පිළිබඳ උපදෙස් එහි ඇතුළත් වෙයි.

පාසලට එන දරුවා, දැනුම, කුසලතා හා ආකල්ප සමගින් සංවරධනය කරමින් ඔවුන් අධ්‍යාපනයේ ඉදිරි අදියර වෙත ගමන් කිරීමට පෙර ප්‍රාථමික අවධියේ, පාසල තුළ සතුටුදායක ඉගෙනුම් පරිසරයක් නිරමාණය කිරීම සඳහා, දී ළමා මිතුරු පාසල් ලෙස ප්‍රාථමික පාසල් ජාලය ක්‍රියාත්මක කිරීම අපගේ අපේක්ෂාවයි. එමෙන්ම සිසුන්ගේ අවශ්‍ය ප්‍රාප්ති මට්ටම්වලට සාරථකව ළඟා වීමටම පෙන්වීමක් ප්‍රාථමික පාසල් පද්ධතිය මගින් සිදුවිය යුතුය. ඒ තුළින් දරුවන් සිය අධ්‍යයන කටයුතුවල සතුටින් නිරතවෙනවා මෙන්ම අධ්‍යාපන ක්‍රියාවලිය තුළින් අපේක්ෂිත අරමුණු ළඟා කර ගත හැකිවනු ඇතැයි. අධ්‍යාපන ඇමැති බන්දුල ගුණවර්ධන මහතා ඒ පිළිබඳ අදහස් දක්වමින් පැවසීය.

එම අවස්ථාවේදී සමුළුව ඇමතූ ශ්‍රී ලංකාවේ යුනිසෙෆ් නේවාසික නියෝජිත රෙසා හොසෙයිනි මහතා "ළමා මිතරු අධ්‍යාපන ක්‍රමවේදය සියලුම සිසුන්ගේ අධ්‍යාපන කටයුතු තීරණාත්මක ලෙස වර්ධනය කරන්නට සමත් වෙන බව විශ්වාසයි. ළමයාගේ සංවර්ධනය සඳහා අවශ්‍ය වන ඉගෙනුම් සහ ඉගැන්වීම ක්‍රියාවලිය පිළිබඳ ගුරු භවතුන්ට පුළුල් අවබෝධයක් මේ නව අධ්‍යාපන අත්පොත ලබා දෙනවා." යනුවෙන් අදහස් දැක්වීය.

යුනිසෙෆ් ආයතනයට මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූල්‍යාධාර සපයනු ලබන්නේ ඕස්ට්‍රේලියානු රජය මඟිනි. "ශ්‍රී ලංකා රජය විසින් දියත් කරනු ලබන ළමා මිතරු පාසල් වයයාපෘතියට අධාර කිරීමට ලැබීම ගැන අප සතුටු වෙනවා. ඉගෙනුම් ක්‍රියාවලිය මෙන්ම ළමුන්ගේ පැමිණීම වර්ධනය කර, ප්‍රාථමික සිසු සිසුවියන් තවදුරටත් පාසල වෙතම රඳවා තබාගන්නට මෙම වැඩසටහන ඉවහල් වනු ඇති." යනුවෙන් වැඩබලන ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් සෝන්‍යා කෝපේ මිය ප්‍රකාශ කළාය.

ළමා අයිතිවාසිකම් පිළිබඳ ජගත් ප්‍රඥප්තියට අනුව, සෑම ළමයෙකුටම සෑම අයිතිවාසිකමක් ම හිමිවන අයුරින් විවිධ පැතිකඩ සයකින් ළමා මිතුරු පාසල් සංකල්පය ක්‍රියාත්මක වෙයි.

ඒ අනුව: අයිතිවාසිකම් අනුව සහ පූර්ව ක්‍රියාකාරකම් ; ලිංගික අනුකූලතා ; ළමා රැකවරණය සහ සෞඛ්‍යය; ශිෂ්‍ය මූලික ක්‍රියාකාරකම්; සහ ළමා මිතුරු ප්‍රතිපත්ති, ක්‍රියාකාරකම් සහ රෙගුලාසි යනාදී අංශවලට අනුගතව ළමා මිතුරු ඉගෙනුම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙයි.

වර්ෂ 2003 සිට යුනිසෙෆ් ආයතනය, AusAID සහ වෙනත් විවිධ ආයතන සමඟ එක්ව අධ්‍යාපන මට්ටම් ඉහළ නැංවීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 76 පමණ වැය කර ඇත. ළමා මිතුරු පාසල් අත්පොත www.unicef.org/srilanka වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

**කරුණාකර වැඩි විස්තර සඳහා විමසන්න;**

**සුසෑන් ඩේවි, යුනිසෙෆ් ශ්‍රී ලංකා සන්නිවේදන නිලධාරිනී, +94 112 832447,**
sdavey@unicef.org